**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (තනතුරු 1), අධ්‍යක්ෂ (තනතුරු 2) යන පුරප්පාඩු තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම**

ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ පහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා **දැනට රාජ්‍ය සේවයේ නියුතු සුදුසුකම්ලත් විධායක නිලධාරීන්ගෙන්** අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් -
   - ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන්
   - ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු වීම අමතර සුදුසුකමකි.

02. අධ්‍යක්ෂ (නීති) -
   - රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ නිලධාරීන් (නීති නිලධාරීන් ද ඇතුළත් වේ.)
   - නීතිවේදී උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු වීම සහ පශ්චාත් උපාධිය සහිත වීම.

03. අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) -
   - රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ නිලධාරීන් (විද්‍යාත්මක සේවයේ නිලධාරීන් ද ඇතුළත් වේ.)
   - විද්‍යාවේදී උපාධිය සහ පශ්චාත් උපාධිය සහිත වීම.

මේ පිළිබඳව වැඩි විස්තර 2017.06.16 දිනැති රජයේ ගැසට් පත්‍රයේ හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ www.nipo.gov.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබා ගත හැක.

නිලධාරීන්, අදාළ ආකෘතියට අනුව සකසාගත් අයදුම්පත්‍රයක් 2017.07.20 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට, අයදුම්පත බහාලන කවරයේ වම්පස කෙලවරේ අයදුම්කරනු ලබන තනතුර සටහන් කර යොමු කළ යුතුය.

තවද, මෙම කාර්යාලයට අනුමත, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් වන සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුර ද පුරප්පාඩු වී ඇති බැවින් ඒ සඳහා ද අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය:**

**බුද්ධිමය දේපළ අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකාවේ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය**
**"සමාගම් මැදුර", 3 වන මහල,**
**අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10**
**දුරකථන අංක: 011 266 91 79/ 011 268 87 68**